**ප්‍රායෝගික කෘෂිකර්මය**

# කරදමුංගු වගාව

කර්දමුංගු ශ්‍රී ලංකාවේ තෙතමනය පවත්නා කඳුකර ප්‍රදේශවල ''මීදුම් රේඛාව'' ට ඉහළින් ස්වාභාවික තත්ත්වයක් යටතේ කැලෑවල සෙවනේ වැවෙන ගසකි.

**පස හා දේශගුණ අවශ්‍යතා**

පස :

කර්දමුංගු ගසේ මුල, පස මතුපිටට ඉතා කිට්ටුවෙන් ඇත. එය වැවෙනුයේ හොඳින් දිය බැස්ම ඇති ජෛන්දිය ද්‍රව්‍ය බෙහෙවින් අඩංගු පසෙහි ය. වතුර රඳා පවත්නා පසර්ට බෙහෙවින් අහිතකර ය. සිනිඳු මැටි පස, හෝ ලොම් පස සුදුසුය. වැලි බෙහෙවින් අඩංගු පසෙහි ඉක්මනින් දිය බැස යන බැවින් ඊට අධික වර්ෂා පතනයක් අවශ්‍යය.

**වර්ෂා පතනය**

හොඳින් බෙදී පවත්නා වර්ෂාපතනයක් ඉතාම යෝග්‍යය. හොඳ පසට අවුරුද්දකට අඩු වශයෙන් අඟල් 100 ක වර්ෂා පතනයක් සෑහේ. වර්ෂාපතනය අඩුවෙන් බෙදී යන ප්‍රදේශවල වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය ඊට වඩා කිබිය යුතුය. විශේෂ යෙන්ම ගුරු පසැති ප්‍රදේශවල අධික වර්ෂා පතනය ඉතාම හනිකරය.

**උෂ්ණත්වය :**

ඉතාම යෝග්‍ය උෂ්ණත්වය පැ. අ ශක 70–75 ය. ඊට වඩා වැඩි උෂ්ණත්වයක් යටතේ වුවද කර්දමුංගු වැවිය හැකි නමුත් වගාව හා නිෂ්පාදනය සරු නොවන්නට පුළුවන.

**ආවරණය :**

ස්වාභාවික කැලෑ ගස් වලින් හෝ වැවූ ගස්වලින් ඉතා හොඳ ඝන ආවරණයක් අවශ්‍යය. ආවරණයක් නොමැතිව කර්දමුංගු වැවිය නොහැක.

**සුළඟ :**

තුනී ආවරණයක් ඇති තැන්හිදී තද සුළඟ කරදරයක් වනු ඇත. ප්‍රමාණවත් ආවරණයක් ඇත්තේ නම් සුළඟ ප්‍රශ්නයක් නොවනු ඇත.

වෙළඳාම සඳහා ශ්‍රී ලංකාවේ වවනුයේ කර්දමුංගු වර්ග දෙකක් පමණි.

(අ) අඩි 2000 ටත් 3000 ටත් අතර උස් භූමිවල වවන මලබාර් වර්ගය.

(ආ) අඩි 3000 ටත් 4500 ටත් අතර උස් භූමිවල වවන මයිසූර් වර්ගය.

ඒවායේ විශේෂ ලක්ෂණ පහත දැක්වේ.

| | මලබාර් වර්ගය | මයිසූර් වර්ග |
|---|---|---|
| (i) ඵලදරන අතු | බිම වැ තිරුණු | කෙළින් |
| (ii) කෝෂය | දිගටි | රවුම් |
| (iii) කොළයේ යට පැත්ත | සේද වැනි | රළු |
| (iv) උස | අඩි 8–10 | අඩි 12–15 |

රයිසෝම හෝ බීජ පැළ හිටවිය හැකි. රයිසෝම හිටවුවහොත් අවුරුදු 3–4 දී ඵල දරන්නට පටන් ගන්නා අතර, බීජ පැල හිටවූවහොත් පළ දැරීමට අවුරුදු 4–5 ක් ගත වනු ඇත. රයිසෝම කෙළින්ම භූමියේම හිටවිය හැක. එහෙත් බීජ පැල පළමුවෙන් විශේෂ තවාන්වල දැමිය යුතුය. රයිසෝම ප්‍රමාණ යෙන් විශාල බැවින් ප්‍රවාහණය කිරීමට වැඩි වියදමක් දරන්නට වේ. එහෙත් ඇට තවාන් දැමීමේ දී පැල සිටවීමට අදහස් කරන භූමිය කිට්ටුවෙන් ම පහසුවෙන් තවාන් සකස් කර ගත හැකි. බීජ පැල සිටවීමෙන් වඩා හොඳ පලදාවක් ලැබෙනු ඇත.

**බීජ :** කර්දමුංගු බීජයේ ප්‍රරෝහණ ශක්තිය දින 7–10 නැතිවී යනු ලැබේ. එහෙයින් වැපිරීම සඳහා ගත යුත්තේ අලුත්ම බීජ වේ. පසෙහි අඩු උෂ්ණත්වය සහ බීජ යේ පිට පොත්ත ඝන බැවින් ස්වාභාවික තත්ත්වයන් යටතේ පැලවීමට සති 12 ක් පමණ ගත වේ. එමනිසා උෂ්ණත්වය වැඩියෙන් පවත්නා අවස්ථාවක වැපිරීමෙන් හා ජලයෙන් පහසුවෙන් උරා ගැනීමට හැකි වනසේ බීජයේ පිට පොත්ත තුනී කිරීමෙන් පැලවීම ඉක්මන් වේ. කරුමුංගු බීජ සහ රළු බොරළු බෝතලයකට හෝ පෙට්ටියකට දමා හොඳින් හෙල්වීමෙන් බීජයේ පිට පොත්ත තුනී කළ හැකිය.

**තවාන් පස :**

පැලකිරීමේ පාත්තිය (පළමු තාවන) සහ ප්‍රධාන සඳහා පහත සඳහන් පස් මිධුනය යෝග්‍ය වේ.

සිහින් හොඳින් දිරාපත් වූ සත්ත්වපෝර කොටස් 3–4 ක්

රළු වැලි කොටස් 1 ක්

තවාන්වල පැළ මැරීයාමට හේතුවන පුස් වැඩීම වළක්වාත්ම සඳහා බීජ වැපිරීමට දින 1–2 පෙර මෙම මිශ්‍රණයට බෝඩෝ මිශ්‍රණයෙන්, ඝන අඩියකට පයින්ට් 1–2 බැගින් මිශ්‍ර කළ යුතුය.

**පැලකරන පාත්තිය හෝ පළමු තවාන**

මෙම තවාන වූකලි, නොගැඹුරු පෙට්ටිවල හෝ පැලවෙන පැල සංඛ්‍යාව අනුව සකස්කරන ලද බිමක හෝ ඉහත සඳහන් පස් මිශ්‍රණයෙන් 3–4'' ඝන තට්ටුවකි. වර්ග අඩියකට බීජ 75 ක් පමණ වැටෙන අන්දමට අඟල් 4 ක පරතරය ඇති පේළි දිගට බීජ වැපිරිය යුතුය. ඒ බීජ එහා මෙහා යාම වළක්වාලීම සඳහා වැලි ටිකක් උඩින් ඉසිය යුතුය. ඉන්පසු පාත්තිය යන්තමින් වැසෙන සේ අලුත් පිදුරු හෝ වියලි තණකොල තට්ටුවකින් අතුරා වතුර දමා ආවරණය කර තැබිය යුතුය. බීජ පැල මාස 4–5 ගතවනතුරු මෙම තවානේම තිබෙන්නට හැරිය යුතුය.

**ප්‍රධාන හෝ 2 වැනි තවාන**

මෙම තවාන සකස් කළ යුත්තේ අඟල් 10ක් පමණ ගැඹුරට බිම කොටා පස බුරුල්කර ගත් ස්ථානයකය. එම තවාන අඩි 3 ක් පළල් විය යුතු අතර ඉහත සඳහන් පස් මිශ්‍රණයෙන් අඟල් 6 ක් පම ගැඹුරු තට්ටුවක් සැකසිය යුතුය. සිටුවීමට යන පැල සංඛ්‍යාව අනුව පාත්තියේ දිග තීරණය කළ යුතුය. පාත්තිවලට හොඳින් වතුර දමා බැස යාමට ඉඩ දිය යුතුය. යූරියා සාන්ද්‍ර, සුපර් පොස්පේට් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් එක පමණ මිශ්‍රකර වර්ග යාරයකට අවුන්ස 1 බැගින් පොහොර දැමිය යුතුය. මාස 4–5 ක් වයසැති නිරෝගී බීජ පැල පළමු තවානෙන් උදුරා පහත සඳහන් දුර ප්‍රමාණයන් අනුව හිටවිය යුතු ය. එනම් :

(අ) බීජ පැල මාන 9 ට අඩුව තිබෙන්ට හරිනවා නම් 6''—6'' දුර ප්‍රමාණයට හෝ

(ආ) බීජ පැල මාස 9 ට වඩා තිබෙන්නට හරිනවා නම් 9''—9'' දුර ප්‍රමාණයට ය.

එසේ පැල සිට වූ පසු අලුතින් ගත් පිදුරු වලින් හෝ වියලි තණකොළ වලින් මුල වසා ආවරණය කර අවශ්‍ය පරිදි වතුර දැමිය යුතුය. සෑම සති 6-8 කට වරක්ම වතුර ගැලුම් 3 ට ඉහත සඳහන් පොහොර මිශ්‍රණයෙන් අවුන්ස 1 ක් දිය කර ඉසිය යුතුය.

දෙවෙනි තවානේ පැලවලට මාස 12–24 ක් වයස ගිය පසු ඉඩමේ සිටවිය හැකිය. මාස 12 ක් ගත වූ විට පැලය අඩි 1 1/2 ක් පමණ උසට වැඩේ. මාස 24 ක් ගත වූ විට අඩි 2–3/12 ක් පමණ උස් වේ. ඒ වනවිට මුලින් අලුත් අංකුර නැඟ ඇත. සාමාන්‍යයෙන් ඉඩමේ හිටවීම සඳහා පොඩි පැල වෙනුවට ලොකු පැල වඩා යෝග්‍යය. මෙම ක්‍රමය තරමක් වියදම් සහිත වුවද දීර්ග කාලීන ප්‍රතිඵල ලැබිය හැකි ක්‍රමයකි.

**ඉඩමේ සිටුවීම**

ආවරණ සැපයීම

ආවරණය ඉතාම අවශ්‍යය. සම්පූර්ණ හිරු එළියෙන් 50% ක් පමණ ලැබෙන්ට සැලසීම ඉතාම හොඳ ප්‍රමාණය වේ. කර්දමුංගු පැළ සිටවීමට කලිගන් ආවරණය සඳහා ගස් සිටවිය යුතුය. තාවකාලික ආවරණ සඳහා ග්ලිරිසිඩියා සහ එරමුදු වැවීම යෙහෙ,කි. සාමාන්‍යයෙන් ස්වාභාවික කැලය යුකලිප්ටස් ඇල්බීසියා, කොස්, සින්කෝනා, කැන්ද ආදිය ස්ථිර ආවරණය සඳහා යෝග්‍ය වේ..

**පරතරය :**

මලබාර් වර්ගය අඩි 8×7 සිට 8×9 පරතරය ඇතිවද, මයිසූර් වර්ගය අඩි 6×6 සිට 7×7 පරතරය ඇතිවද සිටවිය යුතුය.

**වලවල් කැපීම**

වලවල් හැකි තරම් ලොකුවට කැපිය යුතුය. අඩි 1/2 –2 ක් විෂ්කම්බයක් හා අඩි 2–2 1/2 ක් ගැඹුරට වලවල් කැපීම ඉතාම සුදුසු ප්‍රමාණය වේ. සත්ත්ව පෝර හා මතුපිට පස මිශ්‍ර යෙන් වලවල් පිරවිය යුතුය.

**පැළ සිටුවීම**

උඩට වැටී එන රිකිලි සියල්ලම මතුපිටට සිටිනසේ අඟල් 2–3 වඩා යට නොකර පැල සිටුවිය යුතුය. පැළ සිටුවන කාලයේ දී පසෙහි තෙතමනය තිබිය යුතුය. ඒ සඳහා හොඳම කාලය ජූනි අගෝස්තු සහ නොවැම්බර් / දෙසැම්බර් යන මාස වේ.

**නඩත්තු කිරීම**

පොහොර

කර්දමුංගු ආවරණය යහිතව වවන වැවිල්ලක් බැවින් ඊට පොහොර අවශ්‍ය වනුයේ මද ප්‍රමාණයකි. (ඵල නොදරන) නොමේරූ කර්දමුංගු පැලවලටත් (ඵල දරන) මේරූ කර්දමුංගු ගස්වලටත් දැමිය යුතු පොහොර ප්‍රමාණය දළ වශයෙන් පහත දක්වා ඇත.

(1) 1 වැනි අස්වැන්න නෙළන තුරු (අවුරුදු 3) ඇති පැලවල්ට

කුරුල්ලන් වැඩි කර ගැනීම එනම්, පඳුර විශාල කර ගැනීම සඳහා නයිට්‍රජන් බහුල රසායන පොහොර මිශ්‍රණයක් යෙදිය යුතුය.

(අ) මිශ්‍ර ය :

| | | |
|---|---|---|
| යූරියා කොටස් | 3 | 13% න |
| රොක් පොස්පේට් කොටස් | 3 | 8% පී 2 05 |
| මියුරියේට් ඔප් පොටස් (50%) කොටස් | 2 | 10%කේ20 |
| කීසරයිට් කොටස් | 2 | 3% එම්ජී 0 |
| එකතුව කොටස් | 10 | |

(ආ) පෝර යොදන ප්‍රමාණය : අක්කරයකට හොණ්ඩර් 2–2 1/2 යි

(ඇ) පෝර යොදන ක්‍රමය
ජේලි අතර හෝ පඳුරු වටේට පෝර යොද මුල්ලු කළ යුතුය. නියමිත පෝර ප්‍රමාණය යල සහ මහ ආරම්භයක් සමගම දෙවරකට යෙදීම වඩා යෝග්‍යය.

(ii) මේරූ කර්දමුංගු (අවුරුදු 3–15) දක්වා)

ඒකාකුල එනම්, පල දරන රිකිලි වැඩිකර ගැනීම සඳහා නයිට්‍රජන් අඩු රසායන පොහොරක් යෙදිය යුතුය.

(අ) මිශ්‍රණය

| | | |
|---|---|---|
| යූරියා කොටස් | 21/2 | 9% න |
| රොක්පොස්පේට් කොටස් | 5 | 11% ප 2 05 |
| මියුරියේට් ඔප් පොටැප් කොටස් | 21/2 | 13%කේ 2 0 |
| කීසරයිට් කොටස් | 2 | 2% එම ජී 0 |
| එකතුව | 12 | |

(ආ) පෝර යොදන ප්‍රමාණය : අක්කරයකට හොණ්ඩර 3-4 යි.

(ඇ) පෝර යොදන ක්‍රමය.—ජේලි අතර හෝ පඳුරු අතර වටේට පෝර යොද මුල්ලු කළ යුතුයි. නියමිත පෝර ප්‍රමාණය යල සහ මහ ආරම්භයන් සමග ම දෙවරකට වඩා යෙදීම වඩා යෝග්‍යය.

**වල් නෙලීම හා කප්පාදු කිරීම ;**

මද ආවරණය ක් පවත්නා 1 වන වර්ෂය තුළ දී වල් පැළ නෙලීම අවශ්‍යය. හැරීමෙන් රයිසෝම වල්ට හානි විය හැකි බැවින් අතින් වල් පැළෑටි නෙලීම වඩා යෝග්‍යය.

මැරුණු හෝ කැඩුණු රිකිල්ලක් කපා දැමීම හැර කප්පාදු කිරීමක් අවශ්‍ය නොවේ.

**පළිබෝධ හා ලෙඩරෝග මැඩ පැවැත්වීම :**

දළඹුවන් , කීඩෑවුන්, සඳ ගුල්ලන්, කරල් ගුල්ලන් පැළ මැක්කන් වැනි කෘමි පළිබෝධ කර්දමුංගු පැලයට හානි කරති. එම සතුන් විනාශ කිරීම සඳහා මැලතියන්, ඩියස්මන් සහ බීඑච්සි (50% දිය කළ හැකි කුඩු ) වැනි කෘමි නාශක ද්‍රව්‍ය පාවිච්චි කිරීම මැනවි. මෙම කෘමිනාශක ද්‍රව්‍ය පාවිච්චි කිරීම පිළිබඳ උපදෙස් (සුළු අපනයන බෝග) ව්‍යාප්ති නිලධාරියාගෙන් ලබාගත හැක.

ශ්‍රී ල කාවේ කර්දමු ගු වගාවට කෘමි පළිබෝධයන් තරම් බරපතල හානියක් ලෙඩ රෝග වලින් සිදු නොවේ.

**අස්වැන්න ලැබීම සැකසීම හා වර්ග කිරීම :**

අස්වැන්න ලැබීම

අවුරුද්ද මුළුල්ලේම මල් හා ඵල දක්නට ඇතත් ඒවා වැඩි වශයෙන් දක්නට ඇත්තේ සැප්තැම්බර්

මාසයේ සිට ජනවාරි මාසය දක්වා ය. කෝෂ සම්පූර්ණයෙන් ම ඉදෙන්නට ටික කලකට පෙර පොඩි නැටි කෑල්ලකුත් සමඟ කැඩිය යුතුය. හොඳට ඉදුනු ගෙඩි සකස් කිරීමේ දී පුපුරන්නට ඉඩ තිබේ. ඉදීගෙන එන ගෙඩි කැඩීමේ දී හොඳින් පොපැසුනු ගෙඩිවලට හානියක් නොවීමට වගබලා ගත යුතුයි.

වගාව නොමේරූ අවධියේ වර්ෂයකට අක්කරයකින් අමු ගෙඩි රාත්තල් 250–360 ක් පමණ ද අවුරුදු 10–15 පමණ වන විට අමු ගෙඩි රාත්තල් 1000 ක් පමණ ද අස්වැන්නක් ලබා ගත හැක. (වියලි බර රාත්තල් 200)

**සැකසීම**

සැකසීම් යන්නෙන් අදහස් වන්නේ කෝෂ වියලීමය. වියලූ පසු වියලි කර්දමුංගු අනුපාතය 5:1 ක් වේ. අව්වේලා වියළීමේ දී කෝෂය සුදුවීම නිසා එය බාලවන අතර අපනයන වටිනාකම අඩුවේ. උෂ්ණ වාත උදුන්වල දමා වියලීම, ''අමු සැකසීම'' යනුවෙන් හැඳින්වේ. එසේ වියලීමෙන් උසස් තත්ත්වයේ කර්දමුංගු නිපදවා ගත හැකිවන අතර වැඩි අපනයන වටිනාකම ද ඇතිවේ.

''අමු සැකසීම'' කරනුයේ පහත සඳහන් අන්දමිනි.

1. අලුත් ගෙඩි සෝද පිරිසිදු කරන්න.
2. එසන ලද දුම්ගෙයක දමා අංශක පැ. 1.30 ක පමණ උෂ්ණුසුමකින් පැය 3–4 රත් කරන්න
3. අංශක පැ. 105—110 ක උනුසුමක පැය 30ක් පමණ වේලන්න.
4. අංශක පැ. 120 උෂ්ණුසුමක පැයක හෝ දෙකක් පමණ වේලන්න.
5. කෝෂ සිසිල් වූ පසු නැටි කැඩීම සඳහා ගොරෝසු කැන්වස් කැබැල්ලක් හෝ කම්බි දැලක ඇතිල්ලිය යුතුය.
6. පොළා නැටි ඉවත් කළ යුතුය.
7. හානි වූ කුඩා හා ඇදකුද වූ කෝෂ අහුලා ඉවත් කළ යුතුයි.
8. වර්ණය හා හැඩය අනුව දිග, මධ්‍යම හා කෙටි කෝෂ වශයෙන් වර්ග කළ යුතුය.
9. ගෝනිවල දමා තද ආලෝකය නොමැති තැනක අසුරා තැබිය යුතුය. වර්ණය ආරක්ෂා කිරීම සඳහා එම ගෝනිවලට කළු පැහැති පොලිතින් වලින් පෝරු දැමීම යෙහෙකි.

**වර්ග කිරීම**

කර්දමුංගු පහත සඳහන් අන්දමට වර්ග 5 ට බෙදිය හැක.

0 ශ්‍රේණිය (ශ්‍රී ලංකා උසස් වර්ගය)
1 වැනි ශ්‍රේණිය (ශ්‍රී ලංකා විශේෂ)
2 වැනි ශ්‍රේණිය (ඇලිප්පිකිව් අංක 1)
3 වැනි ශ්‍රේණිය (ඇලිප්පිකිව් අංක 2)
4 වැනි ශ්‍රේණිය (ඇලිප්පිකිව්) අංක 3

කර්දමුංගු ශ්‍රේණි සඳහා සම්මත පිරිවිතර

වර්ණය

0 ශ්‍රේණිය සහ 1 වැනි ශ්‍රේණිය : කොළපාට
2 ශ්‍රේණිය සහ 3 වැනි ශ්‍රේණිය : ලා කොළපාට
4 ශ්‍රේණිය : ලා දම්පාට

**පෙනීම :**

කෝෂ හොඳින් පිරී රවුමට හෝ තුන් හුලස් හැඩයට හෝ තිබිය යුතුය. ඒවාට වෘන්ත (නැටි) නොතිබිය යුතු අතර පුපුරා විවර වී නොතිබිය යුතුය.

**රසය :**

එහි ස්වාභාවික රසය කැපී පෙනෙන්නට තිබිය යුතුය. පුස් රසක් හෝ වෙන රසක් හෝ නොතිබිය යුතුය.

**පිරිසිදුකම :**

කර්දමුංගු මියගිය හෝ පණ ඇති කෘමිසත්තු, මී බෙටි, කුණු රොඩු ආදිය නොතිබිය යුතුය.

**හිස් කෝෂ :**

0 ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 1% කි.
1 වැනි ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 2%
බාල ශ්‍රේණිවල තිබිය හැකි උපරිම ප්‍රමාණය 4%–7% කි.

**නොමේරූ හෝ අකිලී රැලි වැටුණු කෝෂ :**

0 ශ්‍රේණියෙහි හා 1 වන ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 1.0%%1.5% කි.
2 ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 2%කි.
3 ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 3%කි.
4 ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 7%කි.

**පුපුරණ ලද කෝෂ :**

0 ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 1 කි.
1 ශ්‍රේණියෙහි තිබිය හැකි උපරිම ප්‍රමාණය 2%කි.
අනෙක් ශ්‍රේණිවල තිබිය හැකි උපරිම ප්‍රමාණය 5%–8% කි.